# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 57 — 1973 අප්‍රේල් 27 වැනි සිකුරාද — 1973.04.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II අ) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 519 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 522 |


## තනතුරු—ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත් වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණය කට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

(ආ) 1973 ජූනි 30 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු වන අතර අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවනු ඇත.

(ඇ) දෙවතාවකට නොවැඩි වාර ගණනක දී ලබාගත් සිංහල/දෙමළ, ගණිතය සහ භෞතික විද්‍යා යන විෂයයන් ඇතුලුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

හෝ

ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය.

හෝ

ඊට සමාන නොහොත් උසස් සහතික පත්‍රයක්.

සහ

(ඈ) ලන්ඩනයේ ඉලෙක්ට්‍රොනික් සහ ගුවන් විදුලි ඉංජිනේරු ආයතනයේ උපාධිධාරී සාමාජිකත්ව පරීක්ෂණයේ 1, 2, 3, 4 සහ 5 වැනි කොටස් වලින් සමත් වී තිබීම.

නැතහොත්

ලංඩනයේ විදුලි ඉංජිනේරු ආයතනයේ උපාධිධාරී සාමාජිකත්ව පරීක්ෂණයේ 1, 2 සහ 3 වැනි කොටස් වලින් සමත් වී තිබීම.

නැතහොත්

"ගුවන් විදුලි ඉංජිනේරු විද්‍යාව" විෂයයක් වශයෙන් ඇතිව ලංඩනයේ රාජකීය ගගන නාවික සංගමයේ ආශ්‍රිත අධි සාමාජිකත්ව පරීක්ෂණයේ 1 හා 2 වැනි කොටස් වලින් සමත් වී තිබීම.

නැතහොත්

පිළිගත් ගුවන් විදුලි හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු ආයතනයකින් ලබාගත් ඊට සමාන සුදුසුකමක්.

**පළපුරුද්ද :**

ගුවන් විදුලි සංදේශ උපකරණ අළුත්වැඩියාව හා මූළුවක්කාදී අළුත්වැඩියාව පිළිබඳ අඩුම වශයෙන් පස් වර්ෂයක පළ පුරුද්දක් තිබිය යුතුය.

නැතහොත්

භූමි ගුවන් විදුලි සංදේශ උපකරණත් වී. ඕ. ආර්./ඇන්. ඩී. බී. ආදිය වැනි භූමි ගුවන් විදුලි යාත්‍රිකාධාරත් අළුත්වැඩියාව හා මූළුවක්කාදී අළුත්වැඩියාව පිළිබඳ අඩුම වශයෙන් සිව් වර්ෂයක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

නැතහොත්

ගුවන් යානා සංදේශ උපකරණත් වී. ඕ. ආර්/ඩී. ඇම්. ඊ. කාලගුණ රේඩාර් යන්ත්‍ර ආදිය වැනි සියළුම ගුවන් යානා ගුවන් විදුලි යාන්ත්‍රික උපකරණත් අළුත්වැඩියාව හා මූළුවක්කාදී අළුත්වැඩියාව පිළිබඳව අඩුම වශයෙන් තෙවර්ෂයක පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වීමෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපක්‍රෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාර ගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතු ය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එව්වේ කවදා දැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ ප්‍රවාහණ අමාත්‍යාංශයේ ලේකම් ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතු ය.

7. අයදුම් පත් හෝ ඒ හා සම්බන්ධිත අනෙක් ලියකියවිලි සියල්ලක්ම ප්‍රවාහණ අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුන බවට දැන්වීමක් නොලැබෙන්නා වූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම ප්‍රවාහණ අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

වී. තී. නවරත්න,
ප්‍රවාහණ අමාත්‍යාංශයේ වැඩබලන ලේකම්.

1973 අප්‍රේල් 11 දින,
කොළඹ—1,
ප්‍රවාහණ අමාත්‍යාංශ කාර්යාලය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### ප්‍රවාහණ අමාත්‍යාංශය

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ගගන නාවික පරීක්ෂක (ගුවන් විදුලි) I ශ්‍රේණිය තනතුර

(1) සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරින්)

(2) තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම්දිය යුතුය.)

(3) (අ) උපන් දිනය :————.
වර්ෂය :——, මාසය :——, දිනය :————.
(ආ) 1973 ජූනි 30 දිනට නියම වයස :————.
වර්ෂ :——, මාස :——, දින :————.

(4) ඔබ ශ්‍රී ලංකා රටවැසියෙක්ද? පාරම්පරික රටවැසියෙක්ද? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක්ද යන බව සඳහන් කරන්න :————.
(ලියා පදිංචි වූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න.)

(5) උපන් ස්ථානය :—.
(අ) අයදුම්කරුගේ :————.
(ආ) අයදුම්කරුගේ පියාගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.
(ඉල්ලුම්කරු උපන්නේ ශ්‍රී ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුය.)

(6) (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහකද? අවිවාහකද? වැන්දඹුවෙක්ද? වැන්දඹුවක්ද යන වග :————.

(7) සාමාර්ථ්‍යය ලබා ඇති ඉහළම විභාගය :————.
(i) සිංහල :————.
(ii) දෙමළ :————.
(iii) ඉංග්‍රීසි :————.

(8) වයස අවුරුදු 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා, විද්‍යාල හා වෙනත් ආයතන—

| සාමාන්‍ය අධ්‍යාපනය | | වෘත්තීය අධ්‍යාපනය | |
|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය සිට | දක්වා | ආයතනය සිට | දක්වා |
| 1. | | 1. | |
| 2. | | 2. | |

9. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ඨත්වය පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :————.

10. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණයගැති වී සිටින්නේ නම් ඒ කොපමණකටද?

11. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

(ලබා ගන්නා ලද සියළුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ්‍යය, වෘත්තීය සුදුසුකම්වල විස්තර, ඒවායේ දිනා පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.)

13. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන්ම කරන ලද රක්ෂාවල් :————.

(රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

සැළකිය යුතුයි—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහත 15 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම් :————.

(දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පලපුරුද්ද ඔබට ඇත්තේ ද? එසේ ඇතොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න.)

15. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

16. මෙම අයදුම් පතෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

4–616—73.04.27 දින අංක 57 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියට උසස් කිරීම සඳහා පැවැත්වෙන සීමිත තරඟ විභාගය**

යථෝක්ත විභාගය සම්බන්ධයෙන් අංක 52 සහ 1973 මාර්තු 23 දින දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති දැන්වීම හා සබැඳෙයි. එකී විභාගාපේක්ෂකයන්ගේ අවධානය පහත සඳහන් කරුණු කෙරෙහි මෙයින් යොමු කෙරේ:—

(අ) මෙම විභාගය පැවැත්වෙනුයේ කලින් නියම කර ඇති පරිදි 1973 ජූනි මස 2 සහ 3 දිනයන්හි නොව, 1973 ජූනි මස 16 සහ 17 දිනයන්හිය.

(ආ) මුද්‍රිත අයදුම්පත්, විභාග කොමසාරිස්වරයා වෙතින් 1973 මැයි මස 03 වන දින දක්වා ලබාගත හැකිය;

(ඇ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනය 1973 අප්‍රේල් මස 23 වන දින සිට 1973 මැයි මස 07 වන දින දක්වා දීර්ඝ කර ඇත;

(ඈ) සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියට උසස් කිරීම සඳහා 1972 වර්ෂයේදී පවත්වන ලද සීමිත තරඟ විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ, එනමුත් එම විභාගයට පෙනී නොසිටි අයදුම්කරුවන්ද මෙවර විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව වන රු. 50 ගෙවීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

2. ඉහත දක්වන ලද වෙනස්කම්වලට යටත්ව විභාගය සඳහා නියමිත රෙගුලාසි නොවෙනස්ව පවතිනු ඇත.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් හා වැඩ බලන රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

1973 අප්‍රේල් මස 19 වන දින,
කොළඹ 7, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

4–731—73.04.27 දින අංක 57 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

[ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| අප්‍රේල් ... | 73.04.06 සිකුරාද ... | 73.03.28 බදාදා | දවල් 12.00 |
| | 73.04.11 බදාදා ... | 73.04.04 බදාදා | දවල් 12.00 |
| | 73.04.19 බ්‍රහස්පතින්දා ... | 73.04.11 බදාදා | දවල් 12.00 |
| | 73.04.27 සිකුරාද ... | 73.04.18 බදාදා | දවල් 12.00 |
| මැයි ... | 73.05.04 සිකුරාද ... | 73.04.25 බදාදා | දවල් 12.00 |
| | 73.05.11 සිකුරාද ... | 73.05.02 බදාදා | දවල් 12.00 |
| | 73.05.18 සිකුරාද ... | 73.05.09 බදාදා | දවල් 12.00 |
| | 73.05.25 සිකුරාද ... | 73.05.15 අඟහරුවාදා | දවල් 12.00 |
| ජූනි | 73.06.01 සිකුරාද ... | 73.05.23 බදාදා | දවල් 12.00 |
| | 73.06.08 සිකුරාද ... | 73.05.30 බදාදා | දවල් 12.00 |
| | 73.06.14 බ්‍රහස්පතින්දා ... | 73.06.06 බදාදා | දවල් 12.00 |
| | 73.06.22 සිකුරාද ... | 73.06.13 බදාදා | දවල් 12.00 |
| | 73.06.29 සිකුරාද ... | 73.06.20 බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.